# දෙවන වාර පරීක්ෂණය - 2024
# කතෝලික ධර්මය i , ii - පිළිතුරු පත්‍රය
# 7 ශ්‍රේණිය

---

**I කොටස**

01. III. දිවැසිවරු ලෙසය.
02. I. ග්‍රීක භාෂාවෙන් ය.
03. II. එළියා ය
04. III. එළියා දිවැසිවරයා ය.
05. II. නාමන්ගේ කුෂ්ඨ රෝගය සුව කිරීම
06. I. ශුද්ධ වූ මතියස් මුනිතුමා.
07. III. ප්‍රසාද ස්නාපනය තුළින්
08. III. ක්‍රිස්මා තෛලයෙන්
09. Iv. පැවිදි පූජක නිකායන්ටය
10. II. හතරවන දේව පණත

**( ලකුණු 2 x 10=20 )**

11. කැරිස්මාව
12. දුෂ්ටාත්ම දුරු කිරීමේ යැදුම
13. පූජකවරුන්ගේ මංගල්‍ය
14. මතෙව් තුමාය
15. පූජා උදව් සමිතියේ

**ලකුණු 2 x 5=10)**

16. හිල්කියා ය.
17. දෙවියන් වහන්සේ ය.
18. කීකරුකම
19. ව්‍රත ශුද්ධිය
20. පූජාප්‍රසාදින් වහන්සේලා ය

**(ලකුණු 2 x 5=10)**

**II කොටස**

**01. I.** ජෙරමියා **( ලකුණු 02 )**

**II.** සුළු දිවැසිවරු 12කිඃ

- ⋆ හොසියා
- ⋆ නාහුම්
- ⋆ හබක්කුක්
- ⋆ ශෙපනියා
- ⋆ හග්ගයි
- ⋆ සෙකරියා
- ⋆ මලාකි
- ⋆ ජෝවෙල්
- ⋆ ආමොස්
- ⋆ ඔබදියා
- ⋆ ජෝනා
- ⋆ මීකා **( ලකුණු 04 )**

**III.**
- දේවස්ථානයට ඇතුළු වන විට දෙදණ නමා, හිස පහත් කර, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නමස්කාර කළයුතු ය.
- දේවස්ථානය තුළ ඔබ මොබ දුව පැන ඇවිදීම නොකළ යුතු ය.
- දේවස්ථානය තුළ සිටින විට කෑ ගැසීම, කථා කිරීම නොකළ යුතු ය.
- දේවස්ථානය තුළ ආහාර පාන නොගත යුතු ය.
- පිරිසිදු ව දේවස්ථානයට පැමිණිය යුතු ය. **(ලකුණු 6 )**

**02. I.** ආබ්‍රම් යන්නෙහි තේරුම "උතුම් පියා" යන්න ය
"ආබ්‍රහම්" යන්නෙහි තේරුම ජාතීන්ගේ පියාණෝ" යන්නය **( ලකුණු 04 )**

**II.** 1. පරිත්‍යාගය 2. අභියෝගය **( ලකුණු 04 )**

**III. ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ගත හැකි ආදර්ශ**

- දෙවියන් වහන්සේ විවිධ කාර්යයන් සඳහා ශිෂ්‍යයන් වන ඔබ කැඳවන සේක. එම කැඳවීමට අවනත වීම සඳහා ඔබ සූදානම් ව සිටිය යුතු ය.
- ලැබෙන කැඳවීමට අනුව හැකි උපරිමයෙන් දෙවියන් වහන්සේට සේවය කළ යුතු ය.
- දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තබා දේව වචනය පිළිගැනීම හා ඒ අනුව ජීවිතය හැඩ ගස්වා ගත යුතු ය.
- අපගේ ජීවිත ගමනේ දී විවිධ දේ පරිත්‍යාග කිරීමට සිදු වන බව පිළිගත යුතු ය.
- අපගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවල දී දේව කැමැත්ත පිළිගෙන ජීවිත වෙනසක් ඇති කර ගත යුතු ය.
- අපට ලැබෙන ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණදීම සඳහා දෙවියන් වහන්සේට නිරතුරු ව යාච්ඤා කළ යුතු ය. **( ලකුණු 06 )**

03. **I.** "සිනාසීම" ( **ලකුණු** 02 )

**II. ඊසාක් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ**

* දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් සිටීම දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම
* දෙමව්පියන්ගේ අවවාදවලට කීකරු වීම ජීවිතයට පැමිණෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීම
* දෙමව්පියන්ට කීකරු යහපත් දරුවකු වීම / අන්‍යයන් සමග ගැටුම් ඇති කර නොගැනීම ( **ලකුණු** 04 )

**III.** අප ද අන් අය සමග කලහ නොකළ යුතු බව අන්‍යයන් සමග ගැටුම් ඇති කර නොගැනීම

* ජීවත් වන පවුල තුළදීත් පාසල තුළදීත් සමාජය තුළදීත් මතු වන ගැටලුවලට විසඳුම වන්නේ, සාමකාමී දිවි පෙවතක් අනුගමනය කිරීම යනාදි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. ( **ලකුණු** 06 )

04. **I.** පියා - ඊසාක් මව - රෙබෙකා ( **ලකුණු** 02 )

II. ඔහු රතු පාට ය, ඔහුගේ ඇඟ පුරා ම ලෝම වැස්මක් මෙන් විය. එබැවින් ඔහුට ඒසව් යන නම දෙන ලදී. ඉන්පසු උපන්නේ ඔහුගේ සහෝදරයා ය. ඔහු තම අතින් ඒසව්ගේ විලුඹ අල්ලාගෙන සිටියේ ය. එබැවින් ඔහුට ජාකොබ් යන නම දෙන ලදි. ( **ලකුණු** 04 )

III. **ඒසව් සමග ජාකොබ් සමගි වීමෙන් ලබා ගතහැකි ආද**

★ වරදක් කළ කල්හි එම වරද පිළිගෙන සමාව ලබා ගත යුතු ය. තමාට වැරදි කළ අයට සමාව දිය යුතු ය. වචනයෙන් සමාව දී ක්‍රියාවෙන් ද එය ඔප්පු කළ යුතු ය. සහෝදරයා සමග සමගියෙන් ජීවත් විය යුතු ය.

05. I. ප්‍රේරිතයෝ / ජේසුස් වහන්සේගේ ගෝලයෝ / ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ ( **ලකුණු** 02 )

II. පේදුරු / ඇන්ඩෘ / සෙබදිගේ පුත් ජාකොබ් ද / ඔහුගේ සොහොයුරු ජොහන් ( **ලකුණු** 04 )

III. **ක්‍රිස්තුන් වහන්සේ ලොවට හඳුන්වා දීමට කළ හැකි දේ**:

★ හොඳින් ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කිරීම / දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම / නොකඩවා ජනවන්දනාවට සහභාගි වීම/ දේව වචනය කියවීම, මෙනෙහි කිරීම හා ඒ අනුව ජීවත් වීම / ධර්මදූත සේවයේ නිරත වීම

★ මීසමේ සමිති සමාගම්වලට බැඳී සේවය කිරීම. ( **ලකුණු** 06 )

06 I. සරල පිළිවෙත් සංග්‍රහය ( **ලකුණු** 02 )

II. ජලය / සුදු වස්ත්‍රය / පාස්කු ඉටිපහන / ඉටිපහන් / ශුද්ධ වූ තෛලය (**ලකුණු** 04 )

III. ශු. සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම. / අන් අයට ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වා දීම. / දසපනතට අනුව ජීවත් වීම. / පොරොන්දු ඉටු කිරීම. / ධර්මදූත සේවාව මගින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම. / මීසමේ පොදු වැඩ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම. / මීසමේ සිදුකරන සමිති, සමාගම්වලට දායක වීම. (යනාදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) ( **ලකුණු** 06 )

07 I. පදවි පූජක හා පැවිදි පූජක ( **ලකුණු** 02 )

II. පැවිදි පූජක නිකායයනට උදාහරණ:

- නිර්මල මරිය නිකාය
- ජේසු නිකාය
- සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය
- දිව්‍ය සත්ප්‍රසාදීය නිකාය
- ෆ්‍රැන්සිස්කාන තුන්වන නිකාය
- ක්ලැරේසියාන නිකාය

පැවිදි සොහෝදරතුමන්ලාට උදාහරණ:

- මාරිස්ට් සහෝදරතුමන්ලා
- ෆ්‍රැන්සිස්කාන ධර්මදූත සහෝදරතුමන්ලා
- ද ලා සාල් සහෝදරතුමන්ලා
- දයාවේ සහෝදරතුමන්ලා

පැවිදි සොයුරියනට උදාහරණ:

- ශුද්ධ වූ පවුලේ පැවිදි සොයුරියෝ
- අපෝස්තලික කාර්මෙල් පැවිදි සොයුරියෝ
- යහපත් එඬේරාගේ පැවිදි සොයුරියෝ
- සූරදූතික පැවිදි සොයුරියෝ
- දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ පැවිදි සොයුරියෝ
- සිරි කුරුස පැවිදි සොයුරියෝ
- දොමිනිකාන පැවිදි සොයුරියෝ ( (**ලකුණු** 04 )

III. යාච්ඤාව ලියා ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න.) ( **ලකුණු** 06 )